රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2020

මගේ අංකය:EST-6/04/LON/0202
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.12.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>පරිපූරක උත්සව ණය යෝජනා ක්‍රමය</u>

නත්තල් සහ නව වසර උදාවත් සමඟ එළඹෙන උත්සව සමය වෙනුවෙන් රජයේ සේවකයන් සඳහා මසකට 0.625% පොළියකට මාස 10කින් ගෙවීමට යටත්ව පරිපූරක උත්සව ණය මුදලක් ලබා දීමට අදාළව උපදෙස් නිකුත් කරන ලෙසට අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි රාජ්‍ය බැංකු ප්‍රධානීන් ද දැනුම්වත් කරමින් ජනාධිපති ලේකම් විසින් ඔහුගේ 2020.12.15 දිනැති ලිපියෙන් මා වෙත දැනුම් දී ඇත.

02. ඉහත නියමය පරිදි ලබා දෙන පරිපූරක උත්සව ණය පහත පරිදි කාණ්ඩ 3කින් සමන්විත වේ.

(අ) මසකට රු. 50,000/-ක් හෝ ඊට වැඩි වැටුප් ලබන සේවකයන් රු. 50,000/-ක ණය මුදලක්

(ආ) මසකට රු. 25,000/-ට වැඩි නමුත් රු. 50,000/-කට අඩු වැටුප් ලබන සේවකයන් රු. 25,000/-ක ණය මුදලක්

(ඇ) මසකට රු. 25,000/-කට අඩු වැටුප් ලබන සේවකයන් රු. 10,000/-ක ණය මුදලක්

03. රජයේ සේවකයන්ට මෙම පරිපූරක උත්සව ණය ලබාගැනීම පහසු කිරීම සඳහා සියලුම ආයතන ප්‍රධානීන් විසින් තම ආයතනවල සේවකයින්ගේ සහතික කළ නාම ලේඛන තම සේවා ස්ථානයට ආසන්නව පිහිටි රාජ්‍ය බැංකුවකට ඉදිරිපත් කළ යුතු ය. එවිට අදාළ බැංකු විසින් ඉල්ලා සිටින පරිපූරක උත්සව ණය මුදල සේවකයින්ගේ බැංකු ගිණුම්වලට බැර කරනු ඇත.

04. ඉහත 03 පරිදි ලබා දුන් ණය මුදල හා ඊට අදාළ පොළිය ආයතන ප්‍රධානීන් විසින් 2021 ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් 31 දින දක්වා මාස 10ක කාලයක් ඇතුළත සේවකයාගේ වැටුපෙන් සමාන වාරික ලෙස අය කර ණය ලබා දුන් බැංකුව වෙත යැවීමට කටයුතු කළ යුතු ය.

05. මෙම පරිපූරක උත්සව ණය මුදල කඩිනමින් ලබා ගැනීමට අවශ්‍ය සියලු විධිවිධාන සලසන මෙන් මෙයින් දන්වා සිටිමි.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය